**කොළඹ විශ්වවිද්‍යාලය**

**ශාස්ත්‍ර පීඨය,**

**අවසාන සෙමෙස්තර පරීක්ෂණය – දෙවන වසර, දෙවන සෙමෙස්තරය - 2016/2017**

**PSC 2226 - සමාජ විද්‍යා පර්යේෂණ ක්‍රමවේද**

**පැ දෙකයි (02)**

**ප්‍රශ්න <u>තුනකට (03)</u> පමණක් පිළිතුරු සපයන්න**

**එක් ප්‍රශ්නයකට උපරිම ලකුණු 20කි**

---

1 (a) "පර්යේෂණය යනු කලින් නොතිබූ දැනුම නිෂ්පාදනය කිරීමයි". සාකච්ඡා කරන්න.

(b) දැනුම නිෂ්පාදනයෙහි නියැලී සිටින පර්යේෂකයන් හට විද්‍යාත්මක දර්ශණවාදයෙහි (Philosophy of Science) ඇති වැදගත්කම පහදන්න.

2 (a) ප්‍රත්‍යක්ෂමූලවාදි විධික්‍රම (Positivist methodologies) වලට එරෙහිව ඇති ප්‍රධානම විවේචනය කුමක්ද?

(b) පැහැදිලි කිරීම (explanation) සහ තේරුම් ගැනීම (understanding) අතර ඇති විධික්‍රමික ද්විධාකරණය (methodological dichotomy) පහදන්න.

3 (a) 'හියුම්ගේ ප්‍රශ්නය' (Hume's Problem) යනු කුමක්ද?

(b) විද්‍යාත්මක ක්‍රමවේදය පිළිබඳ විවාදයට කාල් පොපර්ගෙන් (Karl Popper) ලැබුණු දායකත්වය සාකච්ඡා කරන්න.

4 (a) ප්‍රත්‍යක්ෂමූලවාදි (Positivist) සම්ප්‍රදායට අනුව දැනුම 'විද්‍යාත්මක' වීමට තිබිය යුතු සුදුසුකම් මොනවාද?

(b) සමාජ ලෝකය අධ්‍යයනය කිරීම සඳහා ඔගස්ට් කොම්ට් (Auguste Comte) සහ එමිලි ඩුර්කයිම් (Emily Durkheim) ප්‍රත්‍යක්ෂමූලවාදි සම්ප්‍රදාය යොදා ගත්තේ කෙසේදැයි කෙටියෙන් පහදන්න.

5 (a) තෝමස් කුන්ගේ පැරඩයිමය (Paradigm) පිළිබඳ සංකල්පය පහදන්න.

(b) අර්බුදය (Crisis) සහ විද්‍යාත්මක විප්ලවය (Scientific Revolution) පිළිබඳ තෝමස් කුන්ගේ සංකල්ප නූතන විද්‍යාවේ වර්ධනයට අදාළව සාකච්ඡා කරන්න.

6 (a) 'නූතන විද්‍යාවේ තාර්කිකත්වයෙහි උසස් බව පිළිබඳ විශ්වාසය පෝල් ෆයරාබන්ඩ් විසින් ප්‍රශ්න කරන ලදී'. සාකච්ඡා කරන්න.

(b) විද්‍යාත්මක දැනුමෙහි එන 'වද්‍යය' නැතහොත් 'වැරදිවීමට ඇති හැකියාව' (fallibility) සහ 'සාපේක්ෂතාවාදය' (relativism) පිළිබඳ සංකල්ප සාකච්ඡා කරන්න.

7 (a) පහත දැක්වෙන ගැටළු සම්බන්ධව මාක්ස්වාදී ප්‍රවේශය (Marxist approach) සාකච්ඡා කරන්න.

1 දැනුමෙහි 'විද්‍යාත්මක' භාවය (Scientificity)

2 යථාර්ථය (Reality)

(b) කුමන ඥාන මීමංසාත්මක පදනම් යටතේ මාක්ස්වාදී ප්‍රවේශය, ප්‍රත්‍යක්ෂමූලවාදී ප්‍රවේශය හා සමාන /වෙනස් වේද? පහදන්න.

8 පහත මාතෘකා අතරින් දෙකක් (2) කෙටියෙන් සාකච්ඡා කරන්න.

(i) ඉම්රේ ලකාටෝස්ගේ විද්‍යාත්මක පර්යේෂණය වැඩසටහන (scientific research programme)

(ii) ජෝර්ජ් ලූකාස්ගේ සමස්තය පිළිබඳ අදහස (totality)

(iii) සත්භාවවේදය (ontology) සහ ඥාන මීමංසාව (epistemology)

(iv) මානව වංශ ක්‍රමවේදයෙහි (Ethnomethodology) එන එදිනෙදා ලෝකය පිළිබඳ අදහස (everyday world)

(v) ලුවී අල්තුසර්ගේ සහපාඨ කියවීම පිළිබඳ අදහස (symptomatic reading)